සැ. යු. - 2014.05.23 දින පළ වූ අංක 1,864 දරන ගැසට් පත්‍රයේ I-III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,865 - 2014 මැයි මස 30 වැනි සිකුරාදා - 2014.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 872 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 873 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 874 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 876 |


*සැ. යු.* - රංජිත් සියඹලාපිටිය මිත්‍රත්ව පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 මැයි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජුනි මස 20 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 ජුනි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


871- B 80843- 2,875 (2014/05)
2B4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2014**

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථයක් ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මෙ සඳහා වූ ඉල්ලුම් පත්‍ර 2014 ජුනි මස 16 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසාන දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

සියලු ඉල්ලුම්පත්‍ර, මහාධිකරණ විනිසුරු මහාධිකරණය, මඩකලපුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. ඉල්ලුම්පත්‍ර යැවීමේ දී ලියුම් කවරයේ ඉහල කොටසේ "මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථ ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යනුවෙන් සඳහන් කළ යුතු ය."

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරි තැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මේ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100ක් සමග, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2014 ජුනි මස 13 වැනි දින ප. ව. 3.00 ට අවසන් වනු ඇත.

| *අනු. අංකය* | *වාහනයේ විස්තර* | *වාහනයේ වර්ගය* | *නඩු අංකය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංක* | *තැන්පත් මුදල* |
|---|---|---|---|---|---|
| 01. | ලොරි රථ 01 | LA Ley JS -6297 | ඒආර් 449/11 | MC/BAT/02/2013 | 2,000.00 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම් පත්‍ර 2013 ජුනි මස 16 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහල මිලක් සඳහන් කොට ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබාදෙයි. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ අධිකරණය විසින් සිදු කරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති වාහනය කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදාළ මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතුව නිරීක්ෂණය කළ හැකි ය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියි නම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට ටෙන්ඩර් මණ්ඩලයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් වහාම අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් සිදුකළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ඉහත ටෙන්ඩර් මගින් සිදුකරන විකිණීම් පිළිබඳ අවසන් තීරණය ගැනීම මඩකලපුව සම්පාදන කමිටුව සතු ය.

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
මඩකලපුව.

05-852

# බඩු බාහිරාදිය විකිණීම්

## බස්නාහිර පළාත්බද මහාධිකරණය - පානදුර

පානදුර මහාධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2014.06.28 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළි- ගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ භාර ගැනීමේ දී සහ මුදල් ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිල දී ගැනීමට එන සෑම අයකු ම තම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ ප. ව. 6.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සරෝජනී කුසලා වීරවර්ධන,
බස්නාහිර පළාතේ මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
පානදුර.

2014 මැයි මස මස 05 වැනි දින,
පානදුර මහාධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 1524/01 | කැති 01 |
| | | උදළු 01 |
| 02. | 1875/04 | කැති 01 |
| 03. | 1371/99 | පරණ යකඩ පුටුවක් |
| 04. | 2106/06 | කැඩී ඇති ප්ලාස්ටික් පුටු 01 |
| 05. | 2260/06 | මේසන් හැඳි 01 |
| 06. | 2227/06 | කැති 01 |
| 07. | 1851/04 | කැති 01 |
| 08. | 1894/04 | පොරොවක් |
| 09. | 2193/06 | මෝල්ගස් 01 |
| 10. | 1950/05 | මන්නා පිහි 01 |
| | | කැති 01 |
| | | හිස්වැසුම් 01 |
| 11. | 2610/09 | මෝල්ගස් 01 |
| 12. | 1889/04 | අලවංගු 01 |
| 13. | 1974/05 | යකඩ උල් 01 |
| 14. | 2404/07 | ජංගම දුරකථන 0 1 |
| 15. | 2034/05 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන 01 |
| 16. | 1915/05 | අබලන් පාපැදි 01 |
| 17. | 2017/05 | අබලන් පාපැදි 01 |
| | | අලවංගු 01 |
| 18. | 2779/11 | නොකියා වර්ගයේ දුරකථන 01 |
| | | ගෑස් සිලින්ඩර් 01 |
| 19. | 2083/05 | පරිගණක මොනිටරය |
| | | මුද්‍රණ යන්ත්‍රය |
| | | මධ්‍ය සැකසුම් ඒකකය |
| | | යතුරු පුවරුව |
| | | මවුසය |
| 20. | 2210/06 | ගෑස් සිලින්ඩර 01 |
| | | උඳුන සවිකර ඇති ගෑස් සිලින්ඩර 01 |
| | | පිත්තල සෙම්බු 01 |
| | | හීරෝ වර්ගයේ ලැගේජ් එක සහිත අබලන් පාපැදි 01 |
| | | ජංගම දුරකථනයක් |
| 21. | 2820/11 | ලැප්ටොප් 01 |
| | | ස්කැනර් 01 |
| | | ප්‍රින්ටර් 01 |
| 22. | 2415/07 | රන් ගුලි 02 |
| 23. | 87603(M.C) | ජිප්සි ජෝඩු 01 |
| 24. | 2974/13 | රිදී පැහැති මාල 04 |
| 25. | 2567/09 | බෝකොළයක හැඩැති පෙන්ඩන්ට් 01 |
| | | රන් මාල 01 |
| 26. | 88021 | රන් යැයි කියනු ලබන කරාබු කුට්ටම් 01 |
| 27. | 2722 | කැඩී ගිය අඟුලක් |
| 28. | 2140/06 | අංක 9 ශ්‍රී 3919 දරන යතුරු පැදිය හා හෙල්මට් 01 (අමතර කොටස් ලෙස) |
| 29. | 2639/09 | අංක 200-1956 දරන බජාජ් වර්ගයේ අබලන් ත්‍රීරෝද රථ 01 (අමතර කොටස් ලෙස) |
| 30. | 2895/12 | අංක WPMD 1284 දරන යතුරු පැදිය හා හෙල්මට් 01 |
| 31. | 3020/13 | අංක WPMM 4417 දරන බජාජ් CT 100 වර්ගයේ යතුරුපැදි 01 |
| 32. | 3036/13 | අංක WPMZ 6540 දරන බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරුපැදි 01 |
| 33. | 2412/07 | අංක WPHF 2799 දරන බජාජ් වර්ගයේ අබලන් ත්‍රීරෝද රථ 01 (අමතර කොටස් ලෙස) |
| 34. | - | වහලෙන් ඉවත් කරන ලද උළු තොගයක් |
| 35. | කාර්යාල උපකරණ | අබලන් කැබිනට් (වානේ ලාච්චු 04) 06 |
| 36. | එම | අබලන් ඇඳි පුටු 09 |
| 37. | එම | අබලන් ෆිල්ටර් ස්ටෑන්ඩ් 01 |
| 38. | එම | අබලන් කැල්කියුලේටර් 04 |
| 39. | එම | අබලන් ලී ට්‍රේ 07 |
| 40. | එම | අබලන් කොකු ඇමුණුම් යන්ත්‍ර 04 |

05-764

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි

සමාගමේ නාමය : සිස්-ලින්ක් නෙට්වර්ක් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98410
ලියාපදිංචි දිනය : 2014 මැයි 05
ලිපිනය : අංක 29 වැනි සැතපුම් කණුව, ගාලු පාර, කලමුල්ල, කළුතර දකුණ.

සමාගම් ලේකම්වරු.

05-769

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි

සමාගමේ නාමය : කොරියන් හයර් එඩියුකේෂන් සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 98186
ලියාපදිංචි දිනය : 2014 අප්‍රේල් 17
ලිපිනය : අංක 237/1, හැව්ලොක් පාර, කොළඹ 06.

සමාගම් ලේකම්වරු.

05-770

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

මඩකලපුව ත්‍රිකුණාමලය පාර, ඒරන්ස් මාවත, අංක 365/2 දරන ස්ථානයේ පදිංචි අරුණ කෙන් නොහොත් (අරුණා දේවරාජ්) වන මා විසින් මඩකලපුව, නාවත්කුඩා මදර් පාර, අංක 33 හි පදිංචි ආරුමුගන් කාන්තාමුත්තු නඩරාජා යන අය මාගේ ඇටෝනි බලකරු වශයෙන් පත්කරන ලද මඩකලපුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. චින්නයියා විසින් ලියා සහතික කරන ලද 1993 නොවැම්බර් මස (1) පළවන දිනැති අංක 2125 දරන ඇටර්නි බලපත්‍රය වර්ෂ 2012 ඔක්තෝබර් මස 19 වැනි දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙන අතර වර්ෂ 2012 ඔක්තෝබර් මස 19 වැනි දින සිට එකී ආරුමුගන් කාන්තාමුත්තු නඩරාජා යන අය මා වෙනුවෙන් ඇතුළත් වන කිසිදු ගිවිසුමක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

අරුණ කෙන් නොහොත් (අරුණා දේවරාජ්).

අංක 365/2, ඒරන්ස් මාවත,
ත්‍රිකුණාමලය පාර,
මඩකලපුව.

05-784

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමයි

කැළණිය, වෙද මුල්ල, නුවර පාර, 1 වැනි පටුමග, අංක 102 හි පදිංචි ජෙනිෆර් ඇන්ටනට් පෙරේරා වන මා විසින් කැළණිය, වෙද මුල්ල, නුවර පාර, 1 වැනි පටුමග, අංක 102 හි පදිංචි නෙස්ටා පෙරේරා හෙවත් නෙස්ටා ෆ්‍රැන්සිස් පෙරේරා වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ධර්මවර්දන ජයසිංහ විසින් ලියා සහතික කළ අංක 1518 සහ වර්ෂ 2005.09.01 දිනැති ඇටර්නි බලපත්‍රය වර්ෂ 2014 මැයි මස 09 වැනි දින සිට බලරහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර මින් පසු එකී අය විසින් මාගේ නමින් හෝ මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට බලයකට, ඔප්පුවකට හෝ කරුණකට එකී අය වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

ජෙනිෆර් ඇන්ටනට් පෙරේරා.

2014 මැයි මස 09 වැනි දින.

05-794

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : කිටෝ ක්ලෝතිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 98404
ලියාපදිංචි ලිපිනය : අංක 27 1/1, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.
ලියාපදිංචි කළ දිනය : 2014.05.05 වැනි දින.

සමාගමේ ලේකම්.

05-800

---

## නිවේදනයයි

ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ගල්කිස්ස, වටරප්පොල පාරෙන් එපිට අබේසේකර පාරේ අංක 97 සී පදිංචි ආනන්ද දුෂ්මන්ත ගුණවර්ධන සහ ශ්‍රියා වත්සලා චාන්දනී ගුණවර්ධන යන දෙදෙනා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජා රේණුකා කරුණාරත්න විසින් සහතික කර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙළුම 101/64 දරන පොත්පත්වල සහ අංක 5404 දරන දින පොතෙහි 2012.08.07 දාතමින් යුතුව ලියාපදිංචි කර මා වෙත ලබාදී ඇති අංක 3730 හා 2012 මැයි මස 02 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය එකී ඇටෝර්නි බලපත්‍රයෙහි සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරා ගෙන යනු ලබන බැවින් අංක 3730 දරන එකී ඇටෝර්නි බලපත්‍රය 2013 දෙසැම්බර් මස 31 වැනි දින සිට මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර සහ බලරහිත කරන බව ගල්කිස්ස වටරප්පොල පාරෙන් එපිට අබේසේකර පාරේ අංක 97 සී හි පදිංචි හේමලතා චන්ද්‍රා කරුණාරත්න ගුණවර්ධන වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිමි.

හේමලතා චන්ද්‍රා කරුණාරත්න ගුණවර්ධන.

2014 අප්‍රේල් මස 24 වැනි දින.
05-805

## නිවේදනයයි

ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. පී. එන්. අබේරත්න විසින් සහතික කරන ලදුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි වෙළුම 346/78 දරන පොත්පත්වල සහ අංක 16480 දරන දින පොතෙහි 2006.12.06 දාතමින් යුතුව ලියාපදිංචි කර මා විසින් දෙහිවල, පාමංකඩ, දුටුගැමුණු වීදියේ අංක 58 හි මනෝ රංජන් විජේබාහු වෙත ප්‍රදානය කරන ලද අංක 259 හා 2006 නොවැම්බර් මස 16 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය, එකී බලපත්‍ර අංක 259 හි සඳහන් අවශ්‍යතාවයන් සපුරාලමින් පවතින බැවින් එය මෙයින් අවලංගුකර ප්‍රත්‍යාදිෂ්ඨ කර සහ බලරහිත කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි මහජනතාව වෙත දෙහිවල, පාමංකඩ, දුටුගැමුණු වීදියේ, අංක 58හි පදිංචි රණසිංහ මුදියන්සෙලාගේ තිලකා ශ්‍රියානි මෙයින් නිවේදනය කර සිටිමි.

රණසිංහ මුදියන්සෙලාගේ තිලකා ශ්‍රියානි චන්ද්‍රසිරි.

2014 අප්‍රේල් මස 24 වැනි දින.

05-806

---

## ප්‍රසිද්ධ දැන්වීම

සීමාසහිත ජී එස් එම් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම (සමාගම් අංකය පී වී 97708) වර්ෂ 2014 මාර්තු මස 20 වැනි දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උපවගන්තිය ප්‍රකාරව මෙයින් සැම දෙනාගේ ම දැනගැනීම පිණිස දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය : අංක 934, අගිරිකුල මාවත, කොට්ටාව, පන්නිපිටිය ශ්‍රී ලංකාව.

05-807

---

## දැන්වීමයි

අංක 90/6ජේ/02 ඩන්බාර් පාර, හැටන් හි පදිංචි කන්නප්පන් ශන්කර් වන මා මෙයින් ප්‍රසිද්ධව දන්වා සිටින්නේ මා විසින් 78/2ජේ පොන්නගර් හැටන් හි පදිංචි සොක්කලිංගම් සිවබාලසුන්දරම් නමැති පුද්ගලයා හට 2010.02.20 දින ලබාදුන් අංක 130 දරන ප්‍රතිනිතිබලය 2014.02.28 වැනි දින සිට අහෝසි කරන බව දන්වා සිටිමි.

05-835

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : ඉන්ටර්නැෂනල් හොස්පිටැලිටි මැනේජ්මන්ට් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 93741
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 76, දෙවැනි පටුමග, කොටිකාවත්ත පාර, ගොතටුව නව නගරය
සමාගමේ නව නාමය : ඉන්ටර්නැෂනල් හොස්පිටැලිටි ඇන්ඩ් මැනේජ්මන්ට් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2014 අප්‍රේල් මස 29 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-836

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ද බාත් ස්ටෝර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98336
ලියාපදිංචි ලිපිනය : අංක 68, එස්. ඩී. එස්. ජයසිංහ මාවත, කොහුවල, කළුබෝවිල.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958.

05-842/1

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ජේම්ස් විල්කි ඉන්ටීරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98367
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958.

05-842/2

**ප්‍රසිද්ධ දැන්වීමයි**

සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 4082
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 146, ඩෝසන් වීදිය, කොළඹ 02
සමාගමේ නව නාමය : කෙවිල්ටන් පවර්වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2014.04.02 වැනි දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක/සමාගම් ලේකම්.

05-871

**ප්‍රසිද්ධ දැන්වීමයි**

සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : පී ඊ ප්ලස් කැරුසල් මෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 4167
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 146, ඩෝසන් වීදිය, කොළඹ 02
සමාගමේ නව නාමය : කැරුසල් මෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2014.04.02 වැනි දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක/සමාගම් ලේකම්.

05-872

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| | *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|---|
| 1. | ප්‍රෝ එක්ස් නිව් සීලන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98271 | 2014.04.28 | අංක 104, හැව්ලොක් සෙන්ට්‍රල් ගොඩනැගිල්ල, හැව්ලොක් පාර, කොළඹ 05 |
| 2. | ස්ටඩ් ප්ලස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98366 | 2014.04.30 | අංක 129/1, ශ්‍රී සරණංකර පාර, දෙහිවල. |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-837

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - බදුල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2014.06.27 වැනි දින පෙ. ව. 10.00 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රදේශයේ, රිල්පොල කෝරළයේ වැදිගුතේ පිහිටි "කොලොන්ගහහේන කුඹුර කොලොන්ගහහේන, ගල්ගොඩේ හේන සහ ගල්ගොඩේවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමට අවසරලත් මිනින්දෝරු එම්. එම්. බී. දිසානායක යන අය සෑදූ 2002.04.24 දිනැති අංක 1360 දරන පිඹුරේ නිරූපනය කර ඇති ලොට් 1 වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන්කොට නිර්ණය කර ඇති රූඩ් තුනයි, පර්චස් තිස්හයයි දශම අටක (අ.0 රූ. 03, පර්. 36.8) වපසරියක් ඇති ලොට් 1 ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි වැවිලි ඇතුළු සෑම සියලු දේත් වේ.

වැඩි විස්තර සඳහා 2010.04.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2011.01.10 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - බදුල්ල නගරයේ විහාරගොඩ හන්දියේ සිට පස්සර පාරේ කිලෝමීටර් 4ක පමණ දුර ගොස් 137 වැනි කිලෝමීටර් කණුවේ සිට පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,

2. පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු 01% ක බදු මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද, විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.
6. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුවේ අංක 24, දරන ආර්. එච්. ගුණවර්ධන මාවතේ පිහිටි බදුල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාරතුමා වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 055- 2222165, 055- 2223068
ෆැක්ස් : 055- 2222361.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි ය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ඒ වනවිටත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සාම විනිසුරු ඩබ්. ජයතිලක,
උසාවි කොමසාරිස්, ප්‍රසිද්ධ වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංක : 055- 2230846
072-3438130

05-830

---

## මහජන බැංකුව - බදුල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාවේ, නගර කඩවත් තුළ, කැඳලගම පිහිටි, "දළුක්ගහකුඹුර", "ගල්පොත්තේ කුඹුර" " පිටියේගෙදරයාය කුඹුර" "පිටියේකුඹුර", "දණ්ඩේකුඹුර" "වැල්ලේඅරාවේ පිටිය", "දළුක්ගහකුඹුරේ අස්වනාත සහ ඔයවලානේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් මහතා විසින් 1972.01.06 වැනි දින මැන සාදන ලද අංක 364 දරන පිඹුරු පත ප්‍රකාර බෙදාවෙන් කරන ලද ලොට් 02 දරන කොටස වූ ප්‍රමාණයෙන් පර්චස් විසිපහ (අ. 0 රූ. 0 පර්. 25) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත්.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2014.07.01 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2008.11.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2008.12.01 වැනි දින දිනමිණ, තිනකරන්, ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - බදුල්ල මුතියංගන රජමහා විහාරයේ ප්‍රධාන දොරටුව ආසන්නයේ ඇති ඔරලෝසු කණුව ලඟින් දුම්රියපොළ පාරට ප්‍රවේශ වී මීටර් 25ක් පමණ ගොස් වමට හැරී (මුතියංගණ පන්සලට පිටුපසින් පිහිටි) වටරවුම් පාරේ මීටර් 300ක්පමණ ගමන් කරන විට පාරේ දකුණු පසට කුමාරසිංහ පාර හමුවේ. එහි මීටර් 200ක් පමණ දුරින් පාරේ වම්පස අංක 27 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් පාලන ආයතනයට 01%,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද, විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.
6. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුවේ අංක 24, දරන ආර්. එච්. ගුණවර්ධන මාවතේ පිහිටි බදුල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාරතුමා වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 055- 2222165, 055- 2223068
ෆැක්ස් : 055- 2222361.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි ය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ඒ වන විටත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සාම විනිසුරු ඩබ්. ජයතිලක,
උසාවි කොමසාරිස්, ප්‍රසිද්ධ වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංක : 055- 2230846
055-2222361.

05-831

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ජම්පටා ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2013.06.26 දිනැති සහ අංක 1881 දරන බැදුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ශාන්තලිංගම් ශාන්තකුමාර සහ ශාන්තකුමාර තවනිති යන

අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2014ක් වූ ජූනි මස 25 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හා මහ නගර සභා සීමාව තුළ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලනපොකුණ ග්‍රාම නිලධාරී වසම් අංක 5 දරන ලනුපොකුණ පිහිටි කොළඹ 13, 17 වන පටුමගේ වරිපනම් අංක 25/1 දරන මහවත්ත හෙවත් තලංගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද 1991.06.20 දිනැති අංක 3197 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් ඩී 1 වශයෙන් දැක්වෙන ඉඩම විශාලත්වය පර්චස් හතයි දශම හතක් (අ. 0 රූ. 0 පර්. 7.7) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම නැවත මැනීමකින් පසුව බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් මැන සාදන ලද 2006.05.19 දිනැති අංක 233/2006 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඩී1ඒ වශයෙන් දැක්වෙන ඉඩම විශාලත්වය පර්චස් හතක් (අ. 0 රූ. 0 පර්. 7) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් අංක 1881 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.04.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.04.30 වැනි දින ලක්බිම, තිනකරන් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට බාන් ඔරලෝසු කණුව හන්දියේ ශාන්ත අන්තෝනි මාවත දිගේ ගමන් කොට ශාන්ත අන්තෝනි දේවස්ථානය පසුකොට අලුත්මාවත දෙසට කිලෝ මීටර් 2.3ක් පමණ ගමන් කරන්න. (දුම්කොළ සමාගම පසුකර මීටර් 500ක් පමණ) ඉන්පසුව විද්‍යාල මාවතට දකුණට හැරී, මීටර් 100කට ආසන්න දුරක් ගමන් කොට 16 වන පටුමගට වමට හැරී මීටර් 100ක් පමණ ගොස් 17 වන පටුමගට දකුණට හැරෙන්න. 17 වන පටුමග දිගේ මීටර් 150ක් පමණ ගමන් කොට අතුරුපාරට වමට හැරී මීටර් 50කට ආසන්න දුරක් ගොස් එම පටුමගේ අනන්තයට ගිය විට අදාළ දේපළ 17 වන පටුමගේ වරිපනම් අංක 25/1 වශයෙන් දකුණත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478, 0112- 337707,
ෆැක්ස් අංකය : 0112- 337707.

05-839

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 ඔක්තෝබර් මස 04 දිනැති අංක 1831 දරන *ගැසට් පත්‍රයේ* හා 2013 සැප්තැම්බර් මස 23 වැනි දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014 ජූනි මස 28 වැනි දින පෙ. ව. 10.00 ට මාතර, කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ අංක 39 පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### *උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, මාතර මහ නගර සභා සීමාව තුළ මාතර කොටුවේ අංක 416 සී දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ පිහිටි කොම්පැන්යේ ලිඳගාවවත්ත නොහොත් කොහොඹගහවත්ත නමැති, බර්ටන් හවුස් ලෙස ද, ප්‍රසිද්ධ ඉඩම එහි ඇති සියලු ගොඩනැගිලි ද ඇතුලුව වරිපනම් අංක 15 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී සුනිල් විසින් සාදන ලද 2003 සැප්තැම්බර් මස 12 දිනැති අංක 778 දරන පිඹුරෙහි ලොට් අංක ඒ ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති ලොට් ඒ

උතුරට : විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත ද, නැගෙනහිරට : වරිපනම් අංක 6 (පරණ අංක 106) දරන ස්වස්තික නමැති පරිශ්‍රයද, දකුණට : සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද අංක 1441 දරන පිඹුරෙහි ඇති එම ඉඩමේ ම ලොට් 1 ද, බස්නාහිරට : වරිපනම් අංක 103 දරන කොහොඹගහවත්තේ කොටසක් ද, මායිම්ව එකී අංක 778 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි හතක (අ. 0 රූ. 0 පර්. 27) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩමේ බිම සහ එහි පිහිටි සියලු ගහකොළ සහ ගොඩනැගිලි ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ/456/28 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. ආරියවංශ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
දෙව්නුවර.

05-828

---

**ඩීඑෆ්සීසී වර්ධන බැංකුව පී එල් සී**
(කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 816 සහ 1014 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ මහ නගර සභාවේ සහ දිස්ත්‍රික්කයේ, වනාතමුල්ල කොට්ඨාසයේ දෙමටගොඩ, බේස්ලයින් පාර, ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක ජී 270 (කොටසක්) යන ලිපිනය දරන, බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ ද සිල්වා විසින් සාදන ලද, 1990 අප්‍රේල් මස 02 වැනි දිනැති අංක 1015 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බලයලත් මිනින්දෝරු බී එච් ඒ ද සිල්වා විසින් 2009 දෙසැම්බර් මස 09 වැනි දින අනුමත කරන ලද සීමා නිර්ණය කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 01 පර්. 1.2
එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයේ කොට්ඨාස අංක "ඒ'වෙළුම 630 පත්තිරු අංක 153 යටතේ ලියාපදිංචි කර ඇත.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයකොඩි විසින් සහතික කරන ලද 2009 දෙසැම්බර් මස 15 දිනැති අංක 816 දරන උකස්කරය සහ 2010 නොවැම්බර් මස 29 දිනැති අංක 1014 දරන උකස්කරයන් ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ නීතිගත වූ ලියාපදිංචි අංක පී වී 1656 දරන [පැරණි අංකය N (PVS) 3201] සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 270/55, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 හි පිහිටි කැමිලස් පබ්ලිකේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුවට) උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ.

ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 ජූනි මස 17 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර),
4. රු. 68,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05-798

## සෙලාන් බැංකුව පීඑල්සී - කාත්තන්කුඩි ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි

මෙම දේපළ මඩකලපුව පුන්කුන්දුම් අරයාම්පති හි ව්‍යාපාර ලියාපදිංචි අංක ආර්. ඊ. වී. ආර්. බී එන්/01/බී 1 දරන මෙසස් ලංකා කන්ස්ට්‍රක්ෂන් යන නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෝමසුන්දරම් මහාලිංගම් සහ යෙගේෂ්වරි මහාලිංගම් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වැනි වෙන්දේසිය.-*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි පත්තුවේ අරප්පත්තෙයි ගමේ අරප්පත්තෙයි පිහිටි ප්‍රමාණයෙන් උතුරේ සිට දකුණට බඹ හය හමාරක් (6 1/2) නැගෙනහිර සිට බස්නාහිරට උතුරු පැත්තෙන් බඹ අටහමාරක් (8 1/2) ක් දකුණු පැත්තට බඹ නවයක් (9)ක්ද වන නැගෙනහිර පැත්තට පිහිටි බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සියලු අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙම ඉඩමේ බටහිර කොටසේ නිරිත පැත්තේ කෙළවර දකුණු වැට දිගේ රියන් තුනක් (03) පළල පටුමගක් ඇත.

ඉහත කී දේපළ බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් සාදන ලද 2005.04.04 දිනැති අංක ඒ. එස්./2005/392 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය සභා සීමාව තුළ අරෙයිපට්ටි ගමේ අරයම්පතිහි පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම තුනයි හතක් (අ. 0 රූ. 0 පර්. 9.37) නොහොත් හෙක්ටයාර් 0.0237 ක් විශාල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සියලු අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 ජුනි මස 19 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කාත්තන්කුඩි සෙලාන් බැංකු ශාඛාවේ සිට නව කල්මුනේ පාර ඔස්සේ අරයම්පති දෙසට කි. මී. 1.2ක් පමණ දුරක් ගොස් දකුණු පසට ඇති මායිමෙන් දකුණු පැත්තට ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 600 ක පමණ දුරක් ගිය විට පැරණි කල්මුනේ මාර්ගයට සම්බන්ධ වේ. එම මාර්ගයේ තවත් ඉදිරියට ගිය විට ඇති 5 වන කි. මී. කණුව ද පසුකර තවත් මීටර් 100 ක පමණ දුරක් ගොස් වම්පසට හැරෙන්න. එම මාර්ගය දිගේ මීටර් 75ක පමණ දුරක් ගොස් දකුණු පසට ඇති අඩිපාරට හැරී තවත් මීටර් 25 ක පමණ දුරක් ගිය විට මාර්ගය අවසානයේ අදාල දේපළ පිහිටා ඇත.

*2 වැනි වෙන්දේසිය.* - නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි පත්තුවේ අරෙයිපත්තෙයි පිහිටි ප්‍රමාණයෙන් උතුරට බඹ දහනවය (19) ක් ද, නැගෙනහිරට ඃ දකුණු පැත්තෙන් බඹ දොළහයි හතරෙන් තුනක් (12 3/4) ද, ගිණිකොන කෙළවර බස්නාහිර පැත්තට බඹ හතයි හතරෙන් එකක් (7 1/4) මෙහි සිට උතුරු පැත්තට ඃ බඹ පහක් (5)ක් ද, මෙහි සිට බස්නාහිර පැත්තට නිරිත අයින දක්වා බඹ හතක් (7)ක් ද, බස්නාහිරට ඃ බඹ හයයි හතරෙන් එකක් (6 1/4) ක් වන වක්කඩ්ඩෙයියාර් වලවු නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සියලු අයිතීන් සමග සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත කී දේපළ බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් අඳින ලද 2006.08.22 දිනැති අංක ඒ. එස්/එම්.පී/37 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මඩකලපුව ප්‍රාදේශීය සභා සීමාව තුළ අරෙයම්පති ගමේ පරණ කල්මුනේ පාර පිහිටි සක්කඩ්ඩයාර් වලවු නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම නවයයි හතරක් (අ. 0 රූ. 0 පර්. 18.94) නොහොත් හෙක්ටයාර් 0.0479ක් විශාල සියලු අයිතීන් සහ එහි තුළ පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 ජුනි මස 19 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කාත්තන්කුඩි සෙලාන් බැංකු ශාඛාවේ සිට පැරණි කල්මුනේ පාර ඔස්සේ අරයම්පති පැරණි වෙළඳපල දක්වා පැමිණ වෙළඳපලේ උතුරු දෙසට තවත් මීටර් 25 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ එම මාර්ගයේ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- *රජයේ ගැසට් පත්‍රයේ* 2014.03.07 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2014.03.10 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.02.19 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456475, 2456479.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

05-767

**සෙලාන් බැන්ක් පීඑල්සී - ප්‍රයිවෙට් බැන්කිං (මිලේනියම්) ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ මහනගර සභා සීමාවන් තුළ බම්බලපිටිය වෝඩ් තුළ ඩීන්ස්ටන් පෙදෙසේ පිහිටි ඉඩමට බලයලත් මානක ජී. ඩබ්ලිව්. ෆර්ඩිනැන්ඩ්ස් විසින් 1973.10.23 වැනි දින සාදන ලද අංක 1575 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 02 නැමති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ඩීන්ස්ටන් පෙදෙස වරිපනම් අංක 6 දරන නිවාස ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 11.00

මෙම දේපළ කොළඹ 03 හි පදිංචි සුනේත්‍රා සරසලි ෆැන්සිස්කා ෆොන්සේකා, ජෝෂප් ලියොන් දේශප්‍රිය ෆොන්සේකා, ඇන්ටන් ජයලත් ශ්‍රීනාත් ෆොන්සේකා කොළඹ 03 හි දැන් ඇමරිකා එක්සත් රාජධානියෙහි සෙම්බුගේ දෝන ජානකී ශ්‍රීමති නිර්මලී ෆොන්සේකා යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* කොළඹ සිට ගාලු පාර ඔස්සේ කොල්ලුපිටිය හන්දිය පසු කරමින් ඩීන්ස්ටන් පෙදෙස දක්වා පැමිණ වමට හැරී ඩීන්ස්ටන් පෙදෙසට ඇතුළු වී ස්වල්ප දුරක් ඉදිරියට ගමන් ගත් විට අදාළ දේපළ පිහිටා තිබේ.

2014 ක් වූ ජූනි මස 24 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.08.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2013.08.24 වැනි දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2013.08.21 වැනි දින තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.- ප්‍රධාන කළමණාකාරිනී (නීති),සෙලාන් බැන්ක් පීඑල්සී සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456488/011-2456477/011-2456458.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 071-4755974/071-8446374/077-7761706.
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595.

05-788

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. එච්. ජයසිංහ
ගිණුම් අංක : 0048 50000730

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013 සැප්තැම්බර් මස 26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ හතර ලක්ෂ එකොළොස් දහස් පන්සිය පනස් අටයි ශත විසි හයක (රු. 8,411,558.26) මුදල ද, 2013 අගෝස්තු මස 06 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් එක් ලක්ෂ තිස් දෙදහස් එකසිය හැට හයයි ශත අසූ හතරක (රු. 4,132,166.84) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) රුපියල් දෙලක්ෂ හැට අට දහස් පන්සියයක (රු. 268,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) රුපියල් අසූ දෙදහස් අටසියයක (රු. 82,800) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) රුපියල් දෙලක්ෂ තුන් දහස් හයසියයක (රු. 203,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයක් (9%) හා තවත් රුපියල් තිස් ලක්ෂයක (රු. 3,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.01.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2013.12.31 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2014.06.19 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## පළමු උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්නි හත්පත්තුවේ මීඔයෙන් එගොඩ කෝරළේ ගිරිබාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්සොපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රාජාංගනය කොළණියේ වම් ඉවුරේ ට්‍රැක් 03 හි පිහිටි "මයිලගහපිටියකැලේ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඉරඳතිස්ස කොටඹගේ යන අය විසින් සාදන ලද 2004 මාර්තු මස 25 දාතම හා අංක 7307 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. ජී. හීන්බණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ආර්. එම්. පී. ජයපාල යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පාර සඳහා වෙන්කිරීම නමුත් වඩා නිවැරදිව එම පිඹුරේ ලොට් 02 පාර සඳහා වෙන්කිරීම සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි බිංදුවයි දෙකයි හතරක් (හෙක්ටයාර් 0.2024) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 7307 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව LDO නික/ගිරි/62/201 යටතේ නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත ලොට් 01 1997 අගෝස්තු මස 06 දාතම හා ජය භූමි ප්‍රදාන අංක Kuru/Pra/10879 උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමක් වන අතර එය වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇත :-

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්නි හත්පත්තුවේ මීඔයෙන් එගොඩ කෝරළේ ගිරිබාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්සොපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රාජාංගනය කොළණියේ වම් ඉවුරේ ට්‍රැක් 03 හි පිහිටි "මයිලගහපිටියකැලේ" යයි කියනු ලබන සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. ජී. හීන්බණ්ඩා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ආර්. එම්. පී. ජයපාල යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පාර සඳහා වෙන්කිරීම සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව නික/ගිරි/62/201 යටතේ නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

## දෙවන උපලේඛනය

මෙහි ඉහත සඳහන් පරිශ්‍රයේ ස්ථිරව ස්ථාපිත කොට ඇති හා සවි කොට ඇති යන්ත්‍රාගාර සහ යන්ත්‍රසූත්‍ර පහතින් දැක්වේ:-

| *MODEL* *(මාදිලිය)* | *MACHINE* *(යන්ත්‍රය)* | *No. OF UNITS* *(ඒකක සංඛ්‍යාව)* |
|---|---|---|
| 1. | Elevators Single<br>18 ft. with 3 HP motor | 01 |
| 2. | Elevators Single<br>12 ft. with 3 HP motor | 05 |
| 3. | Elevators Single<br>14 ft. with 3 HP motor | 01 |
| 4. | Elevators Single<br>10 ft. with 3 HP motor | 01 |
| 5. | Husker - LM 24<br>Chinese – MLGT 25S<br>Standard 2002<br>With 7.5 HP Motors | 01 |
| 6. | Husker - (One shot)<br>Chinese – MLGT 25A<br>Standard 2007<br>Serial No. 6131<br>With 7.5 and 2 HP Motor | 01 |
| 7. | Polisher MM 11 Double<br>China 15 HP Motor | 01 |
| 8. | Polisher N 70 China<br>With motor 20 HP<br>Serial No. 75 – 11 KY | 01 |
| 9. | Detoner 2002<br>Indian with 3 HP motor with ran | 01 |
| 10. | Grain and Husk separator<br>With 3 HP Motor China<br>Model MGIZ – 2008 | 01 |
| 11. | Fanel Board | 01 |
| 12. BR -75 | Un –matured paddy ("Bol") and black Seed remover | 1 set |
| S-75 | 4 hour paddy soaking equipment With pump electric starter, Water and steam Distribution system | 1 set |
| HE -75 | Heat exchanger with temperature and Flow controls | 1 set |
| PB – 3 | Par – boiling and steam distribution system | 1 set |
| | Stages for the above machinery 36ft. \ height | 1 set |
| 13. LSU -75 | LSU type dryer with capacity controlling System (Drying capacity from 2000 to 15000 Kgs can be adjusted) | 1 set |
| 14. | E-75Elevator to deliver the paddy to the Un – matured paddy remover and dryer (capacity – 6000 kgs per hr) | 2 Nos |
| 15. | B-75Paddy husk fired, fire tube efficient (Patented) boiler with less heat wastage | 1 set |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

05-834

### පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී එල් සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014ක් වූ ජූනි මස 13 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ වත්තල මාබෝලේ නගර සභා සීමාව ඇතුළත වත්තල, හේකිත්ත පාර, 3 වන පටුමගෙහි පිහිටි, වරිපනම් අංක 36/6, 36/6ඒ, 36/6 බී සහ 36/6 සී දරන "කන්දගේ වත්ත සහ බොළඳපතිරගේ වත්ත සහ කුඹුර" නමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු ගාමිණී බී දොඩන්වෙල විසින් මැන සාදන ලද 2010.08.16 වැනි දිනැති අංක 8030 දරන පිඹුරට අනුව ලොට් 01 දරන කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් ය.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 1116/87 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

විශාලත්වය අ. 0 රූ. 0 පර්. 28.59 හෙවත් වඩාත් නිවැරදි ලෙස අ. 0 රූ. 0 පර්. 29.95.

බලයලත් මානක එස්. සමරවික්‍රම විසින් මැන සාදන ලද වර්ෂ 1999.09.05 දිනැති අංක 189/1999 දරන පිඹුරේ ලොට් 1 ඒ මතින් සහ ඒ ඔස්සේ පොදු මාර්ග අයිතිය ද සහිතවය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012 ක් වූ ජනවාරි මස 27 වැනි දිනැති අංක 2291 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම මැග්නට් ස්ටීල්ස් යන නාමය විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සුප්පයියා සුරේෂ් උකස්කරු සහ බන්දනදායීලෙස ද පෙරියසාමි රමේෂ් බන්ධනදායී ලෙස ද පැහැර හැර ඇති හෙයින්,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.10.04 වැනි දින ඩේලි නිව්ස්, ලක්බිම, සුඩර් ඔළි පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට කිලෝමීටර් 5ක් පමණ වත්තල දක්වා ගමන් කර වමට හැරී හේකිත්ත පාරේ මීටර් 150ක් පමණ ගමන් කර දකුණට හැරී 3 වන පටුමගේ මීටර් 25ක් පමණ ගමන් කරන්න. නැවත වරක් දකුණට හැරී අඩි 12ක් පමණ පාරක් සඳහා වෙන් කළ පාරේ ගමන් කිරීමෙන් පසු මෙම පාරට මුහුණ ලා විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු විසින් එවෙලේ ම පහත සඳහන් වියදම් මුදල් වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්) ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙකහමාරක්) ;
4. ප්‍රචාරණ වියදම් ;
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ;
6. ලිපිකරු සහ සෝෂක ගොස්තු වශයෙන් රු. 1,500ක්.

වෙන්දේසි දිනයේ සිට වැඩකරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කරගැනීම් අංශය, පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667229/011-4667237/011-4667230/ 011-2565573.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777- 672082 ෆැක්ස් අංකය : 011- 2871184.

05-874